**අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2010**

------------------------------------------------------------------------------------------------------------------------

අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 44 දරන අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැළපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 අහිතකර මතය

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ). සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

(ආ). මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ශේෂ පත්‍රයෙහි වත්කම් සහ වගකීම්, ස්ථාවර හා ජංගම ලෙස වර්ගීකරණයකින් තොරව දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

ක්‍රමවත් ගිණුම්කරණ පද්ධතියක් ක්‍රියාත්මක නොවීම, මූලික මූලාශ්‍ර ලේඛන, නියමිත උපයෝගී පොත් හා වාර්තා පවත්වා නොගැනීම හේතුවෙන් කරන ලද නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ පහත දැක්වෙන කරුණු මත ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විශ්වාසය තැබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(අ) 2009 හා 2010 වර්ෂවල අවස්ථා 03කදී මහා භාරකාර දෙපාර්තමේන්තුව අරමුදල වෙත ලබාදී තිබූ රු.3,135,000ක මුදල ගිණුම්ගතකර නොතිබීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති අරමුදලට අයත් එකතුව රු.4,670,000 ක් වූ ගොඩනැගිලි 02 ක වටිනාකම ස්ථාවර වත්කම්වලින් අත්හැරී තිබීම

(ඇ) මහා භාරකාරවරයාගෙන් විගණනය වෙත ලැබී ඇති සනාථ කිරීම් අනුව අරමුදලේ මූලධන සහ අයභාර වියදම් වෙනුවෙන් පිළිවෙලින් රු. 2,000,000 ක් සහ රු.10,288,096 ක් වැයකර ඇති බවත් එම මුදල භාරකාර අරමුදලට අයවිය යුතු බවත් සනාථකර ඇතත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව එවැනි තත්ත්වයක් පෙන්නුම් කර නොතිබීම.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී වැයකරන ලද රු.1,795,813 ක ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් යටතේ ගිණුම්ගතකර තිබීම.

(ඉ) විගණනයට ඉදිරිපත්වූ ගිවිසුම් ප්‍රකාරව ලැබිය යුතු රු.993,000 ක දුරකථන කුළුණු බිම්කුලී ගිණුම්ගත කර නොතිබීම.

(ඊ) අම්බුළුවාව අරමුදල වෙනුවෙන් මහා භාරකාරවරයා විසින් 2009 ඔක්තෝබර් 25 දින ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති රු.15,000,000 ක ස්ථාවර තැන්පතුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා උපචිත රු.875,000 ක පොළී ගිණුම්ගත කර නොතිබීම.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල රු. 189,050 ක ගෙවිය යුතු උද්‍යාන සේවක වැටුප් වර්ෂයේ වියදමක් ලෙස හා රු. 19,942 ක ගෙවිය යුතු විදුලි බිල්පත් වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබීම.

(ඌ) ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද උද්‍යාන සේවක වැටුප් රු.184,150 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබීම.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පහත සඳහන් ගිණුම් විෂයයන් සම්බන්ධයෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකිවිය.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ගෘහ භාණ්ඩ | 1,500,000 | i. උපලේඛන<br>ii. භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| මහා භාරකාර අරමුදල | 15,000,000 | ශේෂ සනාථ කිරීම් |
| බැංකු ශේෂය (9837674) | 1,246,669 | i. බැංකු සැසඳුම් |
| බැංකු ශේෂය (6512857) | 759,801 | ii. ශේෂ සනාථ කිරීම් |
| ඉදිකිරීම් වියදම් | 509,470 | ඇස්තමේන්තු |
| මිලදීගැනීම් | 163,910 | බිල්පත් |

(ආ). ගොවිජන චෛත්‍ය ඉදිකිරීම සඳහා මිලදීගත් රු.17,000 ක් වටිනාකමැති භාණ්ඩ වෙනුවෙන් රු.34,725 ක මුදලක් මෙම අරමුදලින් ගෙවා තිබුණි. මෙම මුදල ගෙවන ලද්දේ කුමන ආයතනයකට හෝ පුද්ගලයෙකුටද යන්න විගණනයේදී තහවුරු නොවුණි.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

-------------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ). අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණය භාර අරමුදලේ පාලක මණ්ඩලයේ 2009 ඔක්තෝබර් 02 දිනැති රැස්වීම් වාර්තාවේ තීරණ අංක I | වර්ෂය සඳහා පාලක මණ්ඩල රැස්වීම් 12ක් පැවැත්විය යුතු වුවද 2010 වර්ෂයේදී පවත්වා තිබුණේ රැස්වීම් 02ක් පමණි. |
| (ආ). භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක පීඑෆ්/423 දරන හා 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ, | |
| 04.3 වගන්තියේ සිට (අ) සිට (ඉ) දක්වා උප වගන්ති | විගණකාධිපතිවරයා වෙත මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් විය යුතු කාර්යසාධන වාර්තා, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සමුච්චිත අරමුදලේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය, මූලික ගිණුම් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක සටහන් ඉදිරිපත්කර නොතිබුණි. |
| (ඇ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 395 | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ). 2009 ජූනි 09 දින අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

----------------------

3.1. මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ශුද්ධ ආදායම රු.1,330,750 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ආදායම රු.731,418 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.599,332 ක වර්ධනයක් දක්නට ලැබුණි.

3.2. ආදායම් පරිපාලනය

-----------------------

රජයේ ප්‍රදාන රු.10,500,000 ක් යොදා ඉදිකළ සියළු පහසුකම් සහිත සංචාරක නිවාස 02ක් අරමුදල සතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ආදායම් ලෙස උපයාගෙන තිබුණේ රු.185,500ක් පමණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණය භාර අරමුදලේ 2009 අංක 44 දරන පනතේ 4 වගන්තියේ (අ) සිට (ත) වූ අරමුණු 20න් අරමුණු 03ක් හැරුණුවිට අනෙකුත් පරිබාහිර අරමුණු ඉටුකිරීම සඳහා අරමුදල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ). ඉතා ආකර්ශණීය දර්ශන පථයකින් යුතු අම්බුළුවාව මහනුවර - නුවරඑළිය මාර්ගයට මායිම්ව පිහිටා තිබුණත් සමාලෝචිත වර්ෂයේ විදේශීය සංචාරකයින් පැමිණ තිබුණේ 620 ක් පමණි.

4.2 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). රජයේ ප්‍රදාන රු.1,800,000 ක් යොදා ඉදිකළ කැපටේරියා අවන්හල ඊට ලබාගත් ගෘහ භාණ්ඩද සමඟ බාහිර පාර්ශවයන් වෙත ව්‍යාපාරික කටයුතු කරගෙන යාම සඳහා ලබාදී තිබුණ නමුත් එයින් කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි.

(ආ). අම්බුළුවාව ශිෂ්‍ය විවේකාගාරයේ කුළුණු සඳහා කලාත්මක අංග එකතුකිරීම් සිදුකළ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ බිල්පත අනුව රු.107,745 ක මුදලක් ගෙවිය යුතුව තිබුණද, ඒ සඳහා මෙම අරමුදලෙන් රු.130,785 ක මුදලක් ගෙවා තිබීම හේතුවෙන් හඳුනාගත නොහැකි කාර්යයන් වෙනුවෙන් රු.23,040 ක් ගෙවා තිබුණි.

(ඇ). අම්බුළුවාව පොත් ඇගයීම් සහ නිර්මාතෘ ඇගයීමේ උළෙලට අදාළ රු.54,250 ක සංග්‍රහ වියදමේ බිල්පත් සඳහා ගෙවා තිබූ රු.20,000 ක අත්තිකාරම් මුදලට අතිරේකව රු.46,250 ක් ගෙවීම හේතුවෙන් රු.12,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

4.3. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). අම්බුළුවාව පිවිසුම් දොරටුව අසල රු.1,270,000 ක් වියදම් කරමින් ඉදිකළ කඩකාමර 03 ක් වසාදමා තිබුණු අතර, ඉන් ඵලදායී ආදායමක් උපයාගැනීමට අවධානය යොමුකර නොතිබුණි.

(ආ). රජයේ ප්‍රදාන රු.10,000,000 ක් භාවිතා කරමින් ඉදිකළ අංග සම්පූර්ණ සම්මන්ත්‍රණ ශාලාවක් අරමුදල් සතු වුවත්, එයින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත අරමුදල් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ප්‍රමාද කාලය වසර 03 කි.

5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

අරමුදලේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුයි.

(අ). ආදායම් පරිපාලනය.
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ගිණුම්කරණය.